# 13 පාඩම
# දුන් දෙය සුව ගෙනදේ

**(සප්පුරිසදාන සූත්‍රය)**

මහණෙනි, සප්පුරිස දාන පහකි. ඒ පහ කවරේ ද යත්.

**01. ශ්‍රද්ධාවෙන් දන් දෙයි.**
**02. සකස් කොට දන් දෙයි.**
**03. සුදුසු කාලයෙහි දන් දෙයි.**
**04. දෙන දෙයෙහි ඇල්මක් නැතිව දන් දෙයි.**
**05. තමා හා අනුන් නොගටා දන් දෙයි.**

01. මහණෙනි, ශ්‍රද්ධාවෙන් දන් දී යම් යම් තැනක දී ඒ දානයේ විපාක ලැබේ ද, එහි දී මහත් ධනයෙන් මහත් භවභෝග සම්පතින් ආඪ්‍ය වෙයි. පොහොසත් වෙයි. ඉතා දැකුම්කළු ප්‍රසන්න ඉහළ ම රූප සෞන්දර්යයෙන් යුක්ත රූමත් කෙනෙක් වෙයි.

02. මහණෙනි, සකසා දන් දී යම් යම් තැනක දී ඒ දානයේ විපාක ලැබෙයි ද, එහි දී මහත් ධනයෙන් මහත් භවගෝග සම්පතින් ආඪ්‍ය කෙනෙක් වෙයි. ඔහුගේ දරුවන් හෝ අඹුවන් හෝ දාසි දස් කම්කරුවන් හෝ වෙත්නම් ඔවුහු කීකරු වෙති. කී දේට කන් දෙති. කී දේ පිළිගැනීමට සිත් යොමු කරති.

03. මහණෙනි, සුදුසු කාලයෙහි දන් දී යම් යම් තැනක දී ඒ දානයේ විපාක ලැබේ ද එහි දී මහත් ධනයෙන් මහත් භවභෝග සම්පතින් ආඪ්‍ය වෙයි. අවශ්‍ය වේලාවට ඔහුගේ ධන සම්පත් වැඩි දියුණු වෙයි. (අවශ්‍යතරම් ධන සම්පත් ලැබෙයි)

04. මහණෙනි, දෙන දේ පිළිබඳ බැඳීමක් නැතිව දන් දී යම් යම් තැනක දී ඒ දානයේ විපාක ලැබේ ද එහි දී මහත් ධනයෙන් මහත් භවභෝගයෙන් ආඪ්‍ය වෙයි. ලැබුණු ධන සම්පත් වැය කොට සිතූ සේ පස් කම් සැප විඳීමට සිත නැමෙයි.

05. මහණෙනි, තමා හා අනුන් නොගටා දන් දී යම් යම් තැනක දී ඒ විපාක ලැබේ නම් එහි දී මහත් ධනයෙන් මහත් භෝගයෙන් ආඪ්‍ය වෙයි. ඔහුගේ ධනයට ගින්නෙන් දියෙන් රජුන්ගෙන් සොරුන්ගෙන් හෝ අප්‍රිය හිමි කම් කියන්නන්ගෙන් යන කිසිවකින් බාධාවක්, කරදරයක්, විනාශයක් නොවෙයි. මහණෙනි, සත්පුරුෂ දාන යනු මේ දාන පහ යි.

## දන් දීම

නිසිපරිදි දන්දෙන්නා ගේ මූලික ලක්ෂණ හයක් ව්‍යග්ඝපජ්ජ හා පත්තකම්ම යන සූත්‍රවල චාග සම්පදාවේ දී විස්තරකර දී තිබේ. එනම්

01. **විගතමලමච්ජේරෙන චෙතසා අගාරං අජ්ඣාවසති.**

මසුරුමලයෙන් තොර සිතින් ගිහි ගේ වාසය කරයි. මසුරුමල යනු තමනුත් භුක්ති නොවිඳින අනුන් භුක්ති විඳිනවාටත් අකමැති, දන් නොදෙන, දුන්නත් ඉවත දමන දෙයක් තෝරා දෙන තරම් මසුරු කමයි.

02. **මුත්තචාගො**

දුන් දේ සිතින් අත හැර දෙන සුලු, නැවත ඒ ගැන තැකීමක් නැති කෙනෙකු වීම.

03. **පයතපාණී**

දීමට ම සෝදා ගත් අත් ඇති, ඒ තරමට දීමට ලැදි කෙනෙකු වීම.

04. **වොසසගගරතො**

තමාසතු දේ අත් හැරීමෙහි යෙදුණ, දෙන්නට කෙනෙකු සොයමින් සිටින්නෙකු වීම.

05. **යාචයොගො**

යදියන්ට හෝ ආධාර ඉල්ලන්නන්ට ඕනෑම මොහොතක ලංවිය හැකි, ඉල්ලීමට සුදුසු කෙනෙකු වීම.

06. **දාන සංවිභාගරතො**

දන් දීමට මෙන් ම සොයුරු සොයුරියන් නෑ හිතවතුන් අසල්වැසියන් සමග බෙදා හදාගෙන භුක්ති විඳීමට හුරු පුරුදු කෙනෙකු වීම.

මෙසේ චාග සම්පත්තියෙන් යුතු දන් දීමෙහි නියුතු පුද්ගලයකු දන් දීමේ දී කෙසේ පිළිපැදිය යුතු ද යන්න මෙම සප්පුරිසදාන සූත්‍රයෙන් ඉගැන්වේ.

01. ශ්‍රද්ධාවෙන් දන් දීම යනු තුනුරුවන් කෙරෙහි විශ්වාසයෙන් ගෞරවයෙන් යුතුව දන් දීම, මහපිනක් යැයි කර්ම කර්මපල විශ්වාසයෙන් යුතුව දන් දීමයි. එසේ දන් දීමෙන් කෙනෙක් ලස්සන වී උපදී.

02. සකසා දන් දීම යනු තමන් සිල්වත් වීම, දෙය්‍ය ධර්මය දැහැමින් උපයාගත් දෙයක් වීම, තමා භුක්ති විඳිනවාට වඩා පිරිසිදුව ප්‍රණීතව දානය පිළියෙල කොට සියලු දේ අනුපිළිවෙළට සකස් කොට ශ්‍රද්ධාවෙන් ගෞරවයෙන් ප්‍රතිග්‍රාහකයන් වඩා හිඳුවා ඉතා සැලකිල්ලෙන් සිදු කරන දානය යි. එසේ දන් දීමෙන් තමාගේ පිරිවර ජනයා තමාට අවනත වෙයි. කෙනෙකුට ඔහුගේ අඹුදරුවන් හෝ සිසුදරුවන්, සේවක සේවිකාවන් හෝ කීකරු නොවන්නේ අවනත නොවන්නේ ඔවුන්ගේ ම වරදින් නොව මෙසේ

තමන් දන් දුන් ආකාරයේ ද වරදින් බව මෙයින් පෙනේ.

**03. සුදුසු කාලයෙහි දන් දීම**

අංගුත්තර නිකායේ පංචක නිපාතයේ සඳහන්වන පරිදි කාල දාන පහකි.

**01. ආගන්තුකයන්ට දන් දීම.**
**02. මගියන්ට දන් දීම.**
**03. ගිලනුන්ට දන් දීම.**
**04. දුර්භික්ෂයෙහි දන් දීම.**
**05. අලුත් සහල් හෝ අලුතින් හැදුණු ඵලාඵල ආදියෙහි පළමු කොටස සිල්වතුන්ට දන් දීම.**
**යන මේ අවස්ථාවන් හි දන් දීම සුදුසු කල්හි දන් දීම යි.**

මෙසේ සුදුසු කල්හි දන් දීමේ විපාකයෙන් තමාට අවශ්‍ය වූ වේලාවට අවශ්‍ය මිල මුදල හෝ අවශ්‍ය ඇප උපකාර ලැබේ.

04. දෙන දෙයෙහි ඇල්මක් නැතිව දීම - එනම් කලින් මුත්තවාගෙ යන්නෙන් කී කාරණය ම යි. යමක් දුන් පසු එය සහමුලින් සිතින් අත්හැර දැමිය යුතු ය. ඒ ගැන පසුතැවිලිවීම හෝ පසුවිපරම් කිරීම හෝ නොකළ යුතු ය. ඇතැමුන්ට කෙතරම් ධනය තිබුණත් ඒවා භුක්ති විඳින්නට නොසිතේ. ඔවුහු ධනය තැන්පත් කර ගෙන අසරණ දුගියන් සේ ජීවත් වෙති. මෙසේ සිදුවන්නේ දෙන දෙය සිතින් අත් හැර නොදීම නිසා ය.

05. තමා හා අනුන් නොගටා දන් දීම - දන් දෙන විට තමාගේ ලොකු කම් ධනවත්කම් බලවත්කම් පෙන්වන්නට හෝ තමා දානපතියෙකැයි කැපී පෙනෙන්නට හෝ දීමත් දන් ලබන පුද්ගලයන්ගේ හැඩරුව ගති ගුණ උස්මිටිකම් සලකා අවඥාවෙන් ඔවුන් පහත හෙළා දන් දීමත්, තමා හා අනුන් ගටා දන් දීම නම් වෙයි. එසේ දීමෙන් විපාක ලබන දවසට දන් දීම නිසා සැපසම්පත් ලැබුණත් ඒවා ආරක්ෂාකර ගැනීමට නොහැකි වෙයි. විවිධ විපත්තිවලින් විනාශ වෙයි.

**අභ්‍යාස**

01. දන්දෙන පින්වතෙකුගේ මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.
02. දන් දීමෙන් භවභෝග සම්පත් ලැබෙනවාට වඩා ලැබිය හැකි විශේෂ ප්‍රතිඵල මොනවාද? ඒවා ලැබිය හැක්කේ කෙසේ දන් දීමෙන්ද?
03. මෙම පාඩම ආශ්‍රයෙන් භුක්තානුමෝදනා දේශනාවක් පිළියෙල කරන්න.

## සප්පුරිසදාන සුත්තං

**(සාවත්ථිනිදානං)**

**48. පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි. කතමානි පඤ්ච:**

සද්ධාය දානං දෙති, සක්කච්චං දානං දෙති, කාලෙන දානං දෙති, අනග්ගහිතචිත්තො[1] දානං දෙති, අත්තානං ච පරං ච අනුපහච්ච දානං දෙති.

සද්ධාය ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. අභිරූපො ච හොති දස්සනියො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො.

සක්කච්චං ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සාති වා කම්මකාරාති වා, තෙපි සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති.

කාලෙන ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. කාලාගතා චස්ස අත්ථා පචුරා හොන්ති.

අනග්ගහිතචිත්තො ඛො[1] පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. උළාරෙසු ච පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති.

අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො. න චස්ස කුතොචි භොගානං උපඝාතො ආගච්ඡති අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියදායාදතො වා.[2]

ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සප්පුරිසදානානීති.